130

සියලු ම හිමිකම් ඇවිරිණි]
முழுப் பதிப்புரிமையுடையது]
All Rights Reserved]

ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව
இலங்கைப் பரீட்சைத் திணைக்களம்
Department of Examinations, Sri Lanka

46 S I

අධ්‍යයන පොදු සහතික පත්‍ර (උසස් පෙළ) විභාගය, 2010 අගෝස්තු
கல்விப் பொதுத் தராதரப் பத்திர (உயர் தர)ப் பரீட்சை, 2010 ஓகஸ்ற்
General Certificate of Education (Adv. Level) Examination, August 2010

හින්දු ශිෂ්ටාචාරය I
இந்து நாகரிகம் I
Hindu Civilization I

පැය තුනයි
மூன்று மணித்தியாலம்
Three hours

විභාග අංකය: ..................................

* 'අ' කොටසේ **පළමුවන** ප්‍රශ්නයටත් 'ආ' කොටසෙන් තෝරාගත් ප්‍රශ්න **හතරකටත්** පිළිතුරු සපයන්න. පිළිතුරු සැපයිය යුතු ප්‍රශ්න ගණන **පහකි.**
* 'අ' කොටසේ ප්‍රශ්නයට පිළිතුරු මෙම පත්‍රයේම ලියා, වෙන් කර, 'ආ' කොටසේ පිළිතුරු පත්‍රය සමඟ අමුණා භාර දෙන්න.

## 'අ' කොටස

(මෙම කොටසට පිළිතුරු **මෙම පත්‍රයේ ම** සපයන්න.)

1.

- අංක **1.1** සිට **1.5** තෙක් එක් එක් ප්‍රශ්නයට වඩාත් ගැළපෙන පිළිතුර තෝරා එහි **අංකය**, දී ඇති **වරහන තුළ** ලියන්න.

1.1 දකුණු ඉන්දියාවේ වෛදික ධර්මය ප්‍රචලිත කළ මුනිවරයා
(1) පරාසර ය. (2) යමදග්නි ය.
(3) වසිෂ්ඨ ය. (4) අගස්තිය ය.
(5) නාරද ය. (.........)

1.2 ශෛව ධර්මයට සමීප සම්බන්ධතාවයක් ඇත්තේ
(1) බෘහදාරණ්‍යක උපනිෂද් ය. (2) මාණ්ඩුක්‍ය උපනිෂද් ය.
(3) කේන උපනිෂද් ය. (4) ශ්වේතාශ්වතාර උපනිෂද් ය.
(5) ඡාන්දෝග්‍ය උපනිෂද් ය. (.........)

1.3 බාලක්‍රිෂ්ණාගේ වීර ක්‍රියාවන් පිළිබඳ පුරාවෘත්ත ඇතුළත් වන්නේ
(1) වායු පුරාණයෙහි ය. (2) භාගවත පුරාණයෙහි ය.
(3) ලිංග පුරාණයෙහි ය. (4) මත්ස්‍ය පුරාණයෙහි ය.
(5) විෂ්ණු පුරාණයෙහි ය. (.........)

1.4 කුමාර දේව උත්පත්තිය විස්තර කෙරෙන මහා කාව්‍ය වන්නේ
(1) දසකුමාර චරිත ය. (2) කිරාතාර්ජුණීය ය.
(3) කුමාර සම්භව ය. (4) හර්ෂ චරිත ය.
(5) උත්තරරාම චරිත ය. (.........)

1.5 ත්‍රිකා ලෙස හඳුන්වනු ලබන ශෛව නිකාය
(1) උත්තර ශෛව ධර්මය වේ. (2) පාසුපත ශෛව ධර්මය වේ.
(3) කාශ්මීර ශෛව ධර්මය වේ. (4) වීර ශෛව ධර්මය වේ.
(5) කාලාමුගම් වේ. (.........)

[ දෙවෙනි පිටුව බලන්න.

- අංක **1.6** සිට **1.10** තෙක් එක් එක් ප්‍රශ්නයේ දී ඇති නම් ලැයිස්තුවේ එකක් අනෙක් ඒවාට ගැලපෙන්නේ නැත. එම නම තෝරාගෙන, එයට අදාළ **අංකය** දී ඇති **වරහන තුළ** ලියන්න.

1.6 (1) දක්ෂිණාමූර්ති (2) ලිංගෝද්භව
(3) අවලෝගිදේෂ්වරර් (4) තිරුපුරාන්තකර්
(5) ගෞරිප්‍රසාද (.........)

1.7 (1) ගාන්ගේයර් (2) කාර්තිකේයර්
(3) විශාකපෙරුමාල් (4) තේවර්පෙරුමාල්
(5) වල්ලවරයන් (.........)

1.8 (1) ශ්‍රී ක්‍රිෂ්ණර් (2) සංකරර්
(3) මාද්වාචාරියර් (4) වේදාන්ත දේශිකර්
(5) මෙයිකන්ඩ තේවර් (.........)

1.9 (1) සින්ධු (2) ගංගා
(3) කාවේරි (4) සරස්වතී
(5) මහානදී (.........)

1.10 (1) වානවන් මාතේවි - ඊස්වරම් (2) රවිකුලමානික්ක - ඊස්වරම්
(3) පන්ඩිතසෝල - ඊස්වරම් (4) මුන්නේෂ්වරම්
(5) උත්තමසෝල - ඊස්වරම් (.........)

- අංක **1.11** සිට **1.15** තෙක් ප්‍රශ්නවලට නිවැරදි පිළිතුරු තිත් ඉර මත ලියන්න.

1.11 සේරමාන් පෙරුමාල් නායනාර්ගේ දේවස්තෝත්‍ර ඇතුළත් ග්‍රන්ථ **දෙකක** නම් ලියන්න.

(1) .................................................. (2) ..................................................

1.12 විජයනගර් සමයේදී වේද පිළිබඳ විවරණයක් ලියූ අයගේ නම් ලියන්න.

..................................................................................................................

1.13 වීරභද්‍රගේ හා වීරනරසිංහගේ පූජා විධි දකුණු ඉන්දියාවේ ප්‍රචලිත වූයේ කුමන කාලය තුළදී ද?

..................................................................................................................

1.14 තිරුක්කෝණේෂ්වරම් පිළිබඳ ස්තලපුරාණ **දෙකක** නම් සඳහන් කරන්න.

(1) .................................................. (2) ..................................................

1.15 චෝල සමය තුළ ලියන ලද ශෛව සිද්ධාන්ත ග්‍රන්ථ **දෙකක** නම් ලියන්න.

(1) .................................................. (2) ..................................................

- අංක **1.16** සිට **1.20** තෙක් ප්‍රශ්නවල දී ඇති එක් එක් ප්‍රකාශය නිවැරදි නම් (✓) ලකුණ ද වැරදි නම් (X) ලකුණ ද ඉදිරියෙහි ඇති වරහන තුළ යොදන්න.

1.16 රුද්‍රා, මහවාන් ලෙස වේද ස්තෝත්‍රවල විස්තර වේ. (.........)

1.17 තිරුඥානසම්බන්දර් මධුරෙර ගිය විට ඔහුට පැපොල රෝගය වැලඳුණි. (.........)

1.18 කාලාමුඛ, ලිංගායද නමින් හඳුන්වනු ලබයි. (.........)

1.19 පල්ලව රජු මහේන්ද්‍රවර්මන් ජෛන ආගමික භක්තිකයකු විය. (.........)

1.20 පළමු රාජරාජගේ විශේෂ නාමය වූයේ සිවපාදසේකරන් ය. (.........)

**

[ තුන්වෙනි පිටුව බලන්න.

සියලු ම හිමිකම් ඇවිරිණි]
முழுப் பதிப்புரிமையுடையது]
All Rights Reserved]

ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව
இலங்கைப் பரீட்சைத் திணைக்களம்
Department of Examinations, Sri Lanka

**46 S I**

අධ්‍යයන පොදු සහතික පත්‍ර (උසස් පෙළ) විභාගය, 2010 අගෝස්තු
கல்விப் பொதுத் தராதரப் பத்திர (உயர் தர)ப் பரீட்சை, 2010 ஓகஸ்ற்
General Certificate of Education (Adv. Level) Examination, August 2010

**හින්දු ශිෂ්ටාචාරය I**
**இந்து நாகரிகம் I**
**Hindu Civilization I**

※ ප්‍රශ්න **හතරකට** පමණක් පිළිතුරු සපයන්න.

**'ආ' කොටස**

2. හින්දු ධර්මය සංවර්ධනයේදී වේදයෙහි වැදගත්කම පහත සඳහන් ද ඇසුරෙන් පැහැදිලි කරන්න.
   (අ) ඇදහීමේ ක්‍රම
   (ආ) දර්ශනික මත
   (ඉ) ආගමික පුරුදු
   (ඊ) ශාස්ත්‍රීය සම්ප්‍රදය

3. "හින්දු ධර්ම ඉතිහාසයේ ස්වර්ණමය යුගය වූයේ ගුප්ත සමයයි." මෙම ප්‍රකාශය පහත සඳහන් ද ඇසුරෙන් පරීක්ෂා කරන්න.
   (අ) සාහිත්‍යය
   (ආ) ආගමික නිකායන්
   (ඉ) කලාව හා ගෘහ නිර්මාණ ශිල්පය

4. ආගම පිළිබඳ ග්‍රන්ථ ලෙස පුරාණවල වැදගත්කම පැහැදිලි කරන්න.

5. චෝල අධිරාජ්‍යයේ වෛෂ්නව ධර්මයේ සංවර්ධනය පිළිබඳව සාකච්ඡා කරන්න.

6. විජයනගර් යුගයේ ආගම්වල තත්ත්වයන් නිරීක්ෂණය කරන්න.

7. ක්‍රි.ව. 1300-1600 කාලපරිච්ඡේදය තුළදී ශ්‍රී ලංකාවේ හින්දු ධර්මයේ ප්‍රධාන සංවර්ධන අවස්ථා පරීක්ෂා කරන්න.

8. හින්දු ධර්මයේ නවීකරණය සඳහා ස්වාමි විවේකානන්දයන්ගේ දයකත්වය පරීක්ෂා කරන්න.

9. පහත දක්වෙන ඕනෑම **හතරක්** පිළිබඳ කෙටි සටහන් ලියන්න.
   (අ) වරුණ
   (ආ) රාමායණය
   (ඉ) කන්තෝසි
   (ඊ) නල්ලූර්හි කන්තස්වාමි කෝවිල
   (උ) ආදිනම්
   (ඌ) ආගමම්

※ ※ ※

107

සියලු ම හිමිකම් ඇවිරිණි]
முழுப் பதிப்புரிமையுடையது]
All Rights Reserved]

ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව
இலங்கைப் பரீட்சைத் திணைக்களம்
Department of Examinations, Sri Lanka

**46 S II**

අධ්‍යයන පොදු සහතික පත්‍ර (උසස් පෙළ) විභාගය, 2010 අගෝස්තු
கல்விப் பொதுத் தராதரப் பத்திர (உயர் தர)ப் பரீட்சை, 2010 ஓகஸ்ற்
General Certificate of Education (Adv. Level) Examination, August 2010

හින්දු ශිෂ්ටාචාරය II
இந்து நாகரிகம் II
Hindu Civilization II

පැය තුනයි
மூன்று மணித்தியாலம்
*Three hours*

විභාග අංකය: ..................................

- ※ 'අ' කොටසේ **පළමුවන** ප්‍රශ්නයටත් 'ආ' කොටසෙන් තෝරාගත් ප්‍රශ්න **හතරකටත්** පිළිතුරු සපයන්න. පිළිතුරු සැපයිය යුතු ප්‍රශ්න ගණන **පහකි.**
- ※ 'අ' කොටසේ ප්‍රශ්නයට පිළිතුරු මෙම පත්‍රයේම ලියා, වෙන් කර, 'ආ' කොටසේ පිළිතුරු පත්‍රය සමඟ අමුණා භාර දෙන්න.

## 'අ' කොටස

(මෙම කොටසට පිළිතුරු **මෙම පත්‍රයේ ම** සපයන්න.)

1.

- අංක **1.1** සිට **1.5** තෙක් එක් එක් ප්‍රශ්නයට වඩාත් ගැලපෙන පිළිතුර තෝරා එහි **අංකය**, දී ඇති **වරහන තුළ** ලියන්න.

1.1 මෙයිකන්ඩාර් සිට ආනව ස්වරූපය පිළිබඳ විමසා බැලුවේ
(1) උමාපති සිවාචාරියර් ය.
(2) අරුණගිරිනාදර් ය.
(3) අරුනන්දි සිවාචාරියර් ය.
(4) පරන්ජෝති මුනිවර් ය.
(5) සනත් කුමාරර් ය.
(.........)

1.2 ශෛව සිද්ධාන්තවලට අනුව ආත්ම වර්ග තුන ඇතුළත් කාණ්ඩය කුමක් ද?
(1) සන්ජිත, ප්‍රාරාත්තුවම්, ආගාමියම්
(2) සකලර්, ප්‍රලයාකලර්, විඥනකලර්
(3) ආනව, කර්ම, මායා
(4) සාත්වික, රාජත, තාමස
(5) අරූප, රූප, අරූරූප
(.........)

1.3 'විෂ්ණු තත්ත්ව නිර්ණය' හි කතුවරයා
(1) රාමානුජ ය.
(2) නිම්බාකර් ය.
(3) මද්දුවර් ය.
(4) වල්ලබාර් ය.
(5) නම්මාල්වාර් ය.
(.........)

1.4 සෝමස්කන්ධ මූර්තියෙහි යොදනු ලැබූ මූර්ධාවල නම් ඇතුළත් වරණය තෝරන්න.
(1) සිව, උමා, විෂ්ණු
(2) සිව, උමා, විනායගර්
(3) සිව, ස්කන්ධ, දේවයානෛ
(4) සිව, උමා, ස්කන්ධ
(5) සෝම, උමා, අයියනාර්
(.........)

1.5 "ස්ත්‍රීන්ව ප්‍රශංසා නොකරන තැන, යාජ්නාවන්හි ප්‍රතිඵලය ශූන්‍ය වේ." මෙම ප්‍රකාශය සඳහන් කෙරෙන ග්‍රන්ථය
(1) අර්ථ ශාස්ත්‍ර වේ.
(2) තිරුක්කුරල් වේ.
(3) ශුක්‍රානීති වේ.
(4) භගවත්ගීතා වේ.
(5) මනුෂ්මෘති වේ.
(.........)

[ දෙවෙනි පිටුව බලන්න.

- අංක **1.6** සිට **1.10** තෙක් ප්‍රශ්නවල දී ඇති එක් එක් ප්‍රකාශය නිවැරදි නම් (✓) ලකුණ ද වැරදි නම් (X) ලකුණ ද ඉදිරියෙහි ඇති වරහන තුළ යොදන්න.

1.6 කාංචි වෛකුන්තපෙරුමාල් කෝවිල සෑදුවේ පළමුවන රාජේන්ද්‍ර රජු ය. (.........)

1.7 බ්‍රාහ්මණ යනු ගුරුවරුන්ගේ සම්ප්‍රදායයි. (.........)

1.8 පානිනි විසින් රචිත ව්‍යාකරණ ග්‍රන්ථයක් වූ අෂ්ටධ්‍යායි හි විග්‍රහයන්ට සම්බන්ධ පළමුවැන්න පෙන්නුම් කරයි. (.........)

1.9 ශ්‍රේෂ්ටරූපන්තරවාදය (විවර්තවාදය) ශෛව සිද්ධාන්ත පිළිගනු ලබයි. (.........)

1.10 ශ්‍රී රංගම් යනු හුණු සහ ගඩොලින් සකස් කරන ලද ගර්භගෘහ හමුවන කෝවිල් වලින් එකකි. (.........)

- අංක **1.11** සිට **1.15** තෙක් ප්‍රශ්නවල හිස්තැන් පිරවීම සඳහා නිවැරදි පිළිතුර තිත් ඉර මත ලියන්න.

1.11 "ඊශ්වර කුමන ස්වරූපයෙන් පෙනී සිටිය ද, ඇය ද එම ස්වරූපයෙන්ම පෙනී සිටියි." මෙම ප්‍රකාශය සඳහන් ග්‍රන්ථය වන්නේ ......................................... ය.

1.12 විශේෂයෙන් ම රිග්වේදයෙහි පෙන්වන නාසතිය ශුද්ධ සඳහන් වන්නේ ............................................ හි ය.

1.13 සාරංගදේව විසින් රචිත ......................................... නමැති ග්‍රන්ථය සංගීත භාණ්ඩාගාරය වේ.

1.14 තමිල්නාඩුවේ පෙරදිග ශාස්ත්‍රීය නර්තනය ශතවර්ෂ ගණනාවක් තිස්සේ හැඳින්වෙන්නේ සතිර් ලෙස ය. මෙය හඳුන්වනු ලබන වෙනත් නාමයක් වන්නේ ......................................................... ය.

1.15 ශිල්ප ශාස්ත්‍ර පිළිබඳ වූ ශිල්පරත්නයෙහි කතුවරයා වන්නේ ................................................ ය.

- අංක **1.16** සිට **1.20** තෙක් ප්‍රශ්නවලට සුදුසු වචන යොදා හිස්තැන් පුරවන්න.

1.16 තාරසුරම් හි ඓරවතිස්වර, චෝල සමයේ තිබූ ප්‍රධාන කෝවිල්වලින් එකකි. එය ඉදිකරනු ලැබුවේ ................................... ශතවර්ෂයේදී ............................................... රජු විසිනි.

1.17 හානි සිදු වීමෙන් පසු වුවද ප්‍රතිෂ්ඨා වැනි පිළිවෙත් නැති වුවද වන්දනාව සඳහා නැවත ස්ථාපනය කරන ලද ලිංගය ................................................... නම් වේ.

1.18 මෙයිකන්ඩ ශාස්ත්‍ර අතුරෙන් .................................... ප්‍රාථමික ග්‍රන්ථයක් ලෙසද ........................................ ද්විතියක ග්‍රන්ථයක් ලෙස ද මහත් සේ ගෞරවයට පාත්‍ර වේ.

1.19 එය නිතර රඳපවතින ස්වරූපයට අනුව එය ස්වරූපය ගන්නා නිසා ආත්මාට දෙන ලද නාමය වන්නේ ................................................... ය.

1.20 පාද වෙනස් කරමින් සිව දෙවියන් නර්තනය ඉදිරිපත් කළ ස්ථානය ........................................ නමින් ද ප්‍රසිද්ධ නටන සභා ................................................ නමින් ද හැඳින්වේ.

* *

[ තුන්වෙනි පිටුව බලන්න.

සියලු ම හිමිකම් ඇවිරිණි]
முழுப் பதிப்புரிமையுடையது]
All Rights Reserved]

ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව
இலங்கைப் பரீட்சைத் திணைக்களம்
Department of Examinations, Sri Lanka

**46 S II**

අධ්‍යයන පොදු සහතික පත්‍ර (උසස් පෙළ) විභාගය, 2010 අගෝස්තු
கல்விப் பொதுத் தராதரப் பத்திர (உயர் தர)ப் பரீட்சை, 2010 ஓகஸ்ற்
General Certificate of Education (Adv. Level) Examination, August 2010

හින්දු ශිෂ්ටාචාරය II
இந்து நாகரிகம் II
Hindu Civilization II

* ප්‍රශ්න **හතරකට** පමණක් පිළිතුරු සපයන්න.

## 'ආ' කොටස

2. "බ්‍රහ්මන් හා ආත්මන් පිළිබඳ විස්තරාත්මකව සාකච්ඡා කිරීමේ ආකාරයෙන් හින්දු දර්ශනික සම්ප්‍රදයේ සුවිශේෂී ස්ථානයක් උපනිෂද් ලබා ගනී." පහත සඳහන් මාතෘකා යටතේ මෙම ප්‍රකාශය සාකච්ඡා කරන්න.
   - (අ) වේදයෙහි සාරය ලෙස උපනිෂද්හි වැදගත්කම
   - (ආ) බ්‍රහ්මන් හා ආත්මන් පිළිබඳ උපනිෂද්හි දෙන ලද පැහැදිලි කිරීම
   - (ඉ) මහාවාක්‍යයන්හි වැදගත්කම
   - (ඊ) ඔබ තෝරාගත් උපනිෂද් එකක කැපී පෙනෙන ලක්ෂණ

3. සංකරර්ගේ අද්වයිත දර්ශනය හා සසඳමින් හින්දු ආධ්‍යාත්මික සම්ප්‍රදයේ රාමානුජර්ගේ විශිෂ්ට ද්වයිතයෙහි කැපී පෙනෙන ලක්ෂණ පහත සඳහන් මාතෘකා යටතේ සාකච්ඡා කරන්න.
   - (අ) විශිෂ්ට ද්වයිතය පැහැදිලි කිරීම
   - (ආ) එම සංකල්පයේ විශේෂ ලක්ෂණ
   - (ඉ) සංකරර්ගේ දර්ශනික සංකල්පවලින් මෙම සංකල්පය කුමන ආකාරයෙන් වෙනස් වේද යන්න
   - (ඊ) ආධ්‍යාත්මික සම්ප්‍රදයේ සංවර්ධනය සඳහා මෙම සංකල්පය දායකවන ආකාරය

4. ලෝකය මැවීම පිළිබඳ ශෛව සිද්ධාන්තයෙහි සඳහන් කෙරෙන මත පහත සඳහන් මාතෘකා යටතේ පැහැදිලි කරන්න.
   - (අ) ලෝකය මැවීමේ ක්‍රමය
   - (ආ) මැවීමේ අරමුණ
   - (ඉ) දෙවියන් හා මායා

5. "වේද සාමාන්‍ය පාඨ ලෙස ද ආගම විශේෂ පාඨ ද වේ." ශෛව සිද්ධාන්ත ඇසුරෙන් මෙම කියමන සාකච්ඡා කරන්න.

6. "කෝවිල් නිර්මාණ ශිල්ප සම්ප්‍රදය තමිල්නාඩුවේ නායක්කර් සමයේ තවදුරටත් සංවර්ධනය විය." එම කාලයේ කෝවිල් සැලකිල්ලට ගනිමින් මෙම ප්‍රකාශය සාකච්ඡා කරන්න.

7. හින්දු කෝවිල්වල ප්‍රතිමා නිර්මාණ ශිල්පයෙහි වැදගත්කම පැහැදිලි කර, ඔබ තෝරාගත් ප්‍රතිමාවක් සම්බන්ධකර ගෙන එහි විශේෂ ලක්ෂණ විස්තර කරන්න.

8. "හින්දු සෞන්දර්ය කලාවන් අතර නර්තන කලාව ලොව පුරා ප්‍රචලිත ය." අදාළ මූලාශ්‍ර ඇසුරෙන් මෙම ප්‍රකාශය පැහැදිලි කරන්න.

9. පහත දක්වෙන ඒවායින් ඕනෑම **හතරක්** පිළිබඳව කෙටි සටහන් ලියන්න.
   - (අ) පාදරායනර්
   - (ආ) පල්ලව රාජ්‍යත්වය හා පරිපාලනය
   - (ඉ) හින්දූන්ගේ ආර්ථික සිද්ධාන්ත
   - (ඊ) තන්ජවූර්හි මහා කෝවිල
   - (උ) කෝවිල් සංගීත කලාව

* * *